**2019/20 මහ කන්නය සඳහා 2019 ඔක්තෝබර් මස 17 වැනි දින**
**පේරාදෙණිය ගන්නෝරුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේදී පැවැත්වූ**
**මහවැලි ජලපාලන කමිටු රැස්වීමේ වාර්තාව**

***සහභාගිවූවෝ:***

| අනු අංක | නම | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා | සභාපති(ජ.පා.කමිටුව) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 02 | පී.කේ.ටී. සමරතුංග මෙය | ලේකම් (ජ.පා.කමිටුව) | ශ්‍රී.ල.ම.අ. ජල පාලන ලේකම් කාර්යාලය, කොළඹ |

**දිසාපතිවරුන් / අතිරේක දිසාපතිවරුන් සහ නියෝජිතවරුන්**

| | | | |
|---|---|---|---|
| 01 | එස්.එම්.පී.කේ. පෙරේරා මහතා | දිසාපති | දිසාපති කාර්යාලය, මාතලේ. |
| 02 | බී.එම්.යු.බී.සරත් චන්ද්‍රසිරි මහතා | දිස්.කෘෂි.අධ්‍යක්ෂ | දිස්.ලේකම් කාර්යාලය, රත්නපුර |
| 03 | එච්.එම්.ආර්.බණ්ඩාර මහතා | දිස්.කෘෂි.අධ්‍යක්ෂ | දිස්.ලේකම් කාර්යාලය, මහනුවර |
| 04 | එච්.එම්.එස්. හේරත් මහතා | සහ. අධ්‍යක්ෂ | දිස්.ලේකම් කාර්යාලය, අනුරාධපුර |

**ප්‍රාදේශීය නියෝජනය**

| | | | |
|---|---|---|---|
| 01 | එස්.එම්.කේ.කුමාරිහාමි මහත්මිය | ප්‍රාදේශීය ලේකම් | ප්‍රා.ලේ. කාර්යාලය, ඇලහැර |
| 02 | එල්.එම්.පී. ගුණතිලක මහතා | සහකාර ප්‍රා. ලේකම් | ප්‍රා.ලේ.කාර්යාලය, ගලෙන්බිඳුනුවැව |

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| 01 | ටී.ජානකී මීගස්තැන්න මිය | වාරි අධ්‍යක්ෂ(ජ.කළ.හා පුහුණු) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 02 | එම්.ආර්.කේ. සමරකෝන් මිය | වාරි අධ්‍යක්ෂ | ප්‍රධාන කාර්යාලය |
| 03 | එම්.ඩබ්.පී ද සිල්වා මහතා | වාරි අධ්‍යක්ෂ | වාරි අ. කාර්යාලය, අනුරාධපුර |
| 04 | එස්.ඒ.ඩී.එන්.සමරසිංහ මහතා | වාරි අධ්‍යක්ෂ | වාරි.අ.කාර්යාලය, බකමූණ |
| 05 | කේ.එච්.එන්.එස්. කුමාර මහතා | වාරි අධ්‍යක්ෂ | වාරි අ.කාර්. රිදීගම පාර, අම්බලන්ගොඩ |
| 06 | ඩී.එම්.ඒ.දෙහෙරගොඩ මහතා | වාරි අධ්‍යක්ෂ | වාරිමාර්ග කාර්. දෙබරවැව,තිස්සමහාරාමය |
| 07 | කේ.එම්.ඒ.පී.කරුණානායක මහතා | වාරි අධ්‍යක්ෂ | වාරි.අධ්‍යක්ෂ කාර්යාලය, මහනුවර |
| 08 | එස්.කේ.හේවාගම මහතා | අධ්‍යක්ෂ | වාරි.අ.කාර්යාලය, පොලොන්නරුව |
| 09 | එම්.පී. අජිත් පුෂ්පකුමාර මයා | සහකාර අධ්‍යක්ෂ | වාරි කළ. අංශය, වාරි.දෙපා. කොළඹ 07 |
| 10 | එස්.කේ. ඉලංගසිංහ මහත්මිය | ප්‍රා. වාරි ඉංජිනේරු | ප්‍රා.වා.ඉ. කාර්යාලය, නාච්චාදූව |
| 11 | ඩබ්.ජේ.එම්.එල්. හේමාල් මහතා | ප්‍රා. වාරි ඉංජිනේරු | ප්‍රා.වා.ඉ. කාර්යාලය, රාජාංගනය |
| 12 | කේ.අකිලන් මහතා | ප්‍රා. වාරි ඉංජිනේරු | ප්‍රා.වා.ඉ. කාර්යාලය, සෝමපුර |
| 13 | ඒ.එම්.ඒ.අයි.බී.අබේසිංහ මහතා | ප්‍රා.වාරි ඉංජිනේරු | ප්‍රා.වාරි.ඉංජි.කාර්යාලය, මින්නේරිය |
| 14 | ඒ.ඩබ්.ඒ.උදයංග මහතා | ප්‍රා.වාරි ඉංජිනේරු. | වාරි.ඉංජි. කාර්යාලය, පොලොන්නරුව |
| 15 | පී.පී.දඹෝරගම මහතා | ප්‍රා.වාරි ඉංජිනේරු | වාරි ඉංජි. කාර්යාලය, කවුඩුල්ල |
| 16 | එච්.විජිත් කොඩිතුවක්කු මහතා | ප්‍රා.වාරි ඉංජිනේරු | වාරි ඉංජි. කාර්යාලය, හුරුළුවැව |
| 17 | එල්.කොටවිලආරච්චි මහතා | ප්‍රා.වාරි ඉංජිනේරු. | වාරි.ඉංජි. කාර්යාලය, අනුරාධපුර |
| 18 | ඩබ්.එන්.ලක්මාල් මහතා | ප්‍රා. වාරි ඉංජිනේරු | වාරි ඉංජිනේරු කාර්. කන්තලේ |
| 19 | ප්‍රියංකා කොස්වත්ත මෙනවිය | ප්‍රා.වාරි ඉංජිනේරු | ප්‍රා.වා.ඉ. කාර්යාලය, මාතලේ |
| 20 | ඒ.එල්. අරවින්ද මහතා | ප්‍රා. වාරි ඉංජිනේරු | වාරි ඉංජිනේරු කාර්. මිනිපේ |
| 21 | ඩී.සී. හෙට්ටිආරච්චි මහතා | ප්‍රා. වාරි ඉංජිනේරු | වාරි ඉංජිනේරු කාර්. පුත්තලම |

| | | | |
|---|---|---|---|
| 22 | එස්.ඒ.එන්. සමන්මලී මෙනවිය | ප්‍රා.වාරි ඉංජිනේරු | ප්‍රා.වාරි.ඉංජි.කාර්යාලය, මාපාකඩ. |
| 23 | ඒ.කේ. අබ්දුල් ජාබර් මයා | ප්‍රා.වාරි ඉංජිනේරු | වාරි අධ්‍යක්ෂ කාර්යා. ත්‍රිකුණාමලය. |
| 24 | ටී. සුගන්තලිංගම් මහතා | වාරි ඉංජිනේරු | ප්‍රා.වාරි.ඉංජි.කාර්යාලය, කොළඹ |
| 25 | ඩබ්.එම්.ඒ.ආර්. වීරසිංහ මෙනවිය | වාරි ඉංජිනේරු | වාරි අධ්‍යක්ෂ කාර්යා. බණ්ඩාරවෙල |
| 26 | ආර්.ඒ.ආර්.වී. ක්‍රිෂාන් මයා | වාරි ඉංජිනේරු | වාරි අධ්‍යක්ෂ කාර්යා. - අනුරාධපුරය |
| 27 | එස්.එන්.බී.එම්. අසාර් මයා | වාරි ඉංජිනේරු | වාරි අධ්‍යක්ෂ කාර්යා. - මඩකලපුව |
| 28. | වයි.ඩබ්. තෙවරප්පෙරුම මහතා | ඉංජිනේරු සහකාර | වාරි ඉංජි. කාර්.- රත්නපුරය |

**<u>වාරි කළමනාකරණ අංශය - වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය</u>**

| | | | |
|---|---|---|---|
| 01 | එස්.ඩී. මැදිවක මහතා | ව්‍යාපෘති අධ්‍යක්ෂ | ව්‍යා. අධ්‍යක්ෂ කාර්. හසලක. |
| 02 | එම්.ජේ.එම්. කලීල් මහතා | නි.ව්‍යා. අධ්‍යක්ෂ | ව්‍යා.කාර්. හසලක. |
| 03 | ඩබ්.එන්.එස්. ප්‍රියන්ත මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්. ගිරිතලේ |
| 04 | කේ.කේ. ඉන්ද්‍රාණි මහත්මිය | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්. රිදීයගම ව්‍යාපාරය |
| 05 | ආර්.ඩී.යූ. රාජසූරිය මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්. කවුඩුල්ල. |
| 06 | එස්.එච්.එල්. දයාපාල මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්.,මොරයාය, මිණිපේ. |
| 07 | එම්.පී.පී.එස්. මැදිවල මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්. සේරුනුවර |
| 08 | එස්.ඩී.එම්.රාජපක්ෂ මහතා | නේ.ව්‍යා.කළමනාකාර | වාරි කළ. අංශය, රාජාංගනය |
| 09 | එච්.එම්.එච්.දිසානායක මහතා | නේ.ව්‍යා.කළමනාකාර | වාරි කළ. අංශය,දඹරාව,මහියංගන |
| 10 | එච්.එම්.දිසානායක මහතා | නේ.ව්‍යා.කළමනාකාර | ව්‍යාපෘති කාර්යාලය, නීලබැම්ම |
| 11 | ජී.ජී.සුනිල් මහතා | නේ.ව්‍යා.කළමනාකාර | වාරි කළ. අංශය, කන්තලේ |
| 12 | පී.එස්. ප්‍රේමකුමාර මහතා | නේ.ව්‍යා.කළමනාකාර | මින්නේරිය ව්‍යාපෘතිය - හිඟුරක්ගොඩ |
| 13 | ටී.එම්.පී.තෙන්නකෝන් මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නුවරවැව ව්‍යාපාරය,පුලියන්කුලම, අනුරා. |
| 14 | ඊ.එම්.ඩබ්.කේ. ඒකනායක මහතා | නේ.ව්‍යා.කළමනාකාර | ව්‍යාපාර කාර්යාලය, හුරුළුවැව. |
| 15 | වයි.එම්.එස්.එස්. යාපා මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්. දඹරාව. |
| 16 | එච්.එම්.එස්.බී. හේරත් මහතා | නේ.ව්‍යා.කළමනාකාර | නේ.ව්‍යා.කළ.කාර්. නාච්චාදූව |
| 17 | කේ. ප්‍රියන්ති පෙරේරා මහත්මිය | ආයතන සං. නිලධාරී | පරාක්‍රම සමුද්‍රය සංකීර්ණය,පොලොන්නරුව. |

**<u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව</u>**

| | | | |
|---|---|---|---|
| 01 | එන්.ඩී.යූ. හෙට්ටිආරච්චි මහතා | ප්‍ර. කෘෂි.ව්‍යා. අධ්‍ය. | ව්‍යා. හා පුහුණු මධ්‍යස්ථාන, කෘෂි. දෙපා. |
| 02 | අරුණි බී. අබේසේකර මිය | සහකාර අධ්‍යක්ෂ | සොබා.සම්.කළ. මධ්‍යස්, පේරාදෙණිය |
| 03 | එම්.යූ.එන්. පුෂ්පකුමාර මයා | කෘෂි උපදේශක | වී පර්. හා සං. ආයතනය බතලගොඩ |
| 04 | ආර්.ඩී. සිරිපාල මහතා | කෘෂි විද්‍යාඥ | සොබා.සම්.කළ. මධ්‍යස්, පේරාදෙණිය |

**<u>ලංකා විදුලිබල මණ්ඩලය</u>**

| | | | |
|---|---|---|---|
| 01 | එම්.ඩී.ආර්.කේ.කරුණාරත්න මහතා | විදුලි ඉංජිනේරු | පද්ධති පාලන අංශය,බත්තරමුල්ල. |
| 02 | ආර්.වී. කුලවර්ධන මහතා | සිවිල් ඉංජිනේරු | 40/2, අඹන්පිටිය පාර,මහනුවර |

**<u>ජාතික ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය</u>**

| | | | |
|---|---|---|---|
| 01 | එස්.කේ.එල්.එස්. රූපසිංහ මහතා | නි. සාමාන්‍යා.(සංවර්ධන) | ගාලු පාර, රත්මලාන |
| 02 | එම්. සුදේෂන් මහතා | නි.සාමාන්‍යා.(නැගෙනහිර) | ජාතික ජල සම්.හා ජලා.මණ්ඩලය. |
| 03 | ෂෙහාන් ධර්මසිංහ මහතා | ප්‍රධාන ඉංජිනේරු | ගාලු පාර, රත්මලාන |
| 04 | එන්.වී.එච්.එස්.කේ. විතානගේ මහතා | සහකාර ඉංජිනේරු | අනුරාධපුරය |
| 05 | මංජුලා රාජපක්ෂ මිය | සහකාර ඉංජිනේරු | ගැටඹේ, පේරාදෙණිය |

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

| | | | |
|---|---|---|---|
| 01 | චන්ද්‍රා සෙනරත් මෙනවිය | අධ්‍යක්ෂ (ගංගාද්‍රෝණි) | ගංගාද්‍රෝණි කාර්. මඩාටුගම |
| 02 | නෙවිල් රාජපක්ෂ මහතා | අධ්‍යක්ෂ (කෘෂි) | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 03 | එම්.එල්.ඩී.එල්.එම්. අබේවර්ධන මහතා | අධ්‍යක්ෂ (ආ.සං.) | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 04 | අයි.එම්.යූ.කේ. කුමාර මහතා | නේ.ව්‍යා.කළ., එච්, | නේ.ව්‍යා.කළ. කාර්., තඹුත්තේගම |
| 05 | තුෂාර දන්තනාරායන මහතා | නේ.ව්‍යා.කළ. ,බී, | බී කලාපය, වැලිකන්ද. |
| 06 | ඒ.එල්. ඔස්මන් ද සිල්වා මහතා | නේ.ව්‍යා.කළ. | නේ.ව්‍යා.කළ. කාර්.,ඇඹිලිපිටිය. |
| 07 | කේ.ඒ.සී. විමල් කුමාර මහතා | නේ.ව්‍යා. කළ. | සී කලාපය, දෙහිඅත්තකණ්ඩිය |
| 08 | ටී.එන්. ජයරත්න මහතා | නේ.ව්‍යා.කළ. | නේ.ව්‍යා.කළ. කාර්. හුරුළුවැව |
| 09 | ප්‍රසන්න ජයතිලක මහතා | නේ.ව්‍යා.කළ. | ඩී කලාපය, මැදිරිගිරිය. |
| 10 | ඒ.පී.ටී. හේමන්ත ජයසිංහ මහතා | නේ.ව්‍යා.කළ. | නේ.ව්‍යා.කළ.කාර්. මොරගහකන්ද. |
| 11 | ජේ.ඒ.ල්.බී. ජයසූරිය මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ප්‍ර.වේ.හා.ජලාශ මෙ.අං.,දිගන |
| 12 | එච්.එම්.එල්.ආර්. හේරත් මහතා | නි.අ. /කා.හා.ඉංජිනේරු | කා.හා.ඉංජි.කා.,බෝවතැන්න. |
| 13 | ඩී.එම්. ධර්මදාස මහතා | කා.හා. ඉංජිනේරු | කා.හා.ඉංජි.කා., රන්දෙණිගල. |
| 14 | සුජීව ගුණසේකර මහතා | කා.හා. ඉංජිනේරු | කා.හා.ඉංජි.කා., ඇඹිලිපිටිය. |
| 15 | පී.එස්. බණ්ඩාර මහතා | කා.හා.ඉංජිනේරු | කා.හා.ඉංජි.කාර්. මොරගහකන්ද |
| 16 | ඩබ්.ඒ.ඩී. විජේසුන්දර මහතා | කා.හා.ඉංජිනේරු | කා.හා.ඉං. කාර්. මාදුරුඔය |
| 17 | එන්.කේ.එල්.එස්.කේ. ඩයස් මහතා | කා.හා. ඉංජිනේරු | කා.හා.ඉංජි.කා., මාපාකඩ. |
| 18 | වී.ඒ. පුෂ්පකුමාර මහතා | කා.හා. ඉංජිනේරු | කා.හා.ඉංජි.කා.,පොල්ගොල්ල. |
| 19 | ඩබ්.ඒ.සී.එල්. වෝල්ටර් මහතා | නි.නේ.ව්‍යා.කළ. ,සී, | නේ.ව්‍යා.කළ. කාර්. දෙහිඅත්ත. |
| 20 | එස්.එච්.ආර්. වසන්ත මහතා | නි.නේ.ව්‍යා.කළ.(තාක්.) | බී කලාපය, වැලිකන්ද. |
| 21 | කේ.ඩී.ජේ. ප්‍රේමලාල් මහතා | නි.නේ.ව්‍යා.කළ. (ඉංජි.) | නේ.ව්‍යා.කළ. කාර්. තඹුත්තේගම |
| 22 | තිලක් රණසිංහ මහතා | නි.නේ.ව්‍යා.කළ | නේ.ව්‍යා.කළ.කාර්. වලව |
| 23 | පී.කේ.ඩබ්. සිරිවර්ධන මහතා | නි.නේ.ව්‍යා.කළ. | නේ.ව්‍යා.කළ.කාර්. මොරගහකන්ද |
| 24 | පී.ඒ.එන්.එච්. තිලකරත්න මහතා | නි.නේ.ව්‍යා.කළ. | නේ.ව්‍යා.කළ.කාර්. හුරුළුවැව |
| 25 | එච්.කේ.එන්. විල්බට් මිය | ප්‍රධාන ඉංජිනේරු | ප්‍ර.වේ.හා.ජලාශ මෙ.අං.,දිගන |
| 26 | ඩී.කේ. නවරත්න මිය | ප්‍රධාන ඉංජිනේරු | ප්‍ර.වේ.හා.ජලාශ මෙ.අං.,කොත්මලේ |
| 27 | ඩී.සී. වීරතුංග මහතා | සිවිල් ඉංජිනේරු | බී කලාපය, වැලිකන්ද. |
| 28 | පී.සී.ආර්. දයාරත්න මහතා | සිවිල් ඉංජිනේරු | ඩී. කලාපය (තා.අං.) මැදිරිගිරිය. |
| 29 | පී.ඩබ්.ජේ. වසන්තා මිය | සිවිල් ඉංජිනේරු | කා.හා.ඉංජි.කා., වික්ටෝරියා |
| 30 | කේ.එම්.සී.එම්. කුලතුංග මහතා | සිවිල් ඉංජිනේරු | ප්‍රධාන කාර්යාලය කොළඹ |
| 31 | ඩබ්.එච්.එස්.බී. විජේරත්න මහතා | සිවිල් ඉංජිනේරු | නේ.ව්‍යා.කළ. කාර්. වලව |
| 32 | ආර්.පී.ටී.එච්. රාජපක්ෂ මිය | කාර්මික සහකාර | නේ.ව්‍යා.කළ. කාර්. වලව |

## ජල කළමනාකරණ ලේකම් කාර්යාලය

| | | | |
|---|---|---|---|
| 01 | එම්.එල්.නිමන්ති මංජුලා මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ(ජල කළ.) | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 02 | සඳුන් ගලප්පත්ති මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ(ජල කළ.) | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 03 | දමිත් වීරසිංහ මහතා | සිවිල් ඉංජිනේරු | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 04 | වී.ආර්.සී. ද මෙල් මහතා | සිවිල් ඉංජිනේරු | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 05 | සමීර පියතිලක මහතා | සං.සහකාර | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 06 | ධම්මිකා ද සිල්වා මෙය | ජලවිද්‍යා සහකාර | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 07 | එම්.ආර්.එෆ්.රක්ෂානා මෙය | ජලවිද්‍යා සහකාර | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 08 | ආර්.කේ.ඒ.ප්‍රියංකා මිය | කළ. සහකාර | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 09 | ලතිකා වීරසිංහ මිය | ලඝු/යතුරු ලේඛිකා | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 10 | එච්.එම්.එස්.ජේ.එස්. හේරත් මිය | කළ. සහකාර | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 11 | උත්පල සමරනායක මහතා | වාරිමාර්ග සේවක | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |
| 12 | කණිෂ්ඨ ලහිරු මහතා | වාරිමාර්ග සේවක | ජලපාලන අංශය, ශ්‍රී ලං ම.අ.,කොළඹ |

**ගොවි නියෝජිත**

| | | | |
|---|---|---|---|
| 01 | එච්.එම්. අනුර නන්දසිරි මහතා | සභාපති | 38, විජයපුර, දියසෙන්පුර, පොලොන්නරුව |
| 02 | ඒ.පී.වී.පී.එස්. ගමගේ මහතා | සභාපති | උඩවෙල බරවර්ධනඔය (මිණිපේ) |
| 03 | එම්.ආර්.එම්. ප්‍රියන්ත රත්නායක මහතා | සභාපති | අංක199, ගල්තලාව, දේවගල පොලොන්නරුව |
| 04 | ඒ.එම්. ගුණරත්න මහතා | සභාපති | 473/1, වාන්ඇල, කන්තලේ. |
| 05 | බී.පී. උපාලි කුමාරතුංග මහතා | සභාපති | අංක 85, කාවන්තිස්සපුර, සේරුවිල |
| 06 | බී.පී. ගුණපාල මහතා | සභාපති | කන්තලේ ව්‍යාපාර ගොවි සංවිධානය, කන්තලේ. |
| 07 | කේ. රම්‍යලතා මහත්මිය | සභාපති | අංක 18/A/19, අග්බෝපුර, කන්තලේ |
| 08 | එච්.පී.ගාමිණී ජයරත්න මහතා | සභාපති | 504/285-1, ගඟේයාය, කෝට්ටපිටිය |
| 09 | එච්.එම්. උපාලි ඒකනායක මහතා | සභාපති | ඒකාබද්ධ ගො.සංවිධානය, ගලෙන්බිඳුනුවැව |
| 10 | ඩබ්.ජගත් අරුණකීර්ති මහතා | සභාපති | 681,ගම්පහකඩේ, පොළොන්නරුව |
| 11 | බී.එම්. රංජිත් බණ්ඩාර මහතා | සභාපති | 788/3, යාය 11, ජයන්තිපුර, පොලොන්නරුව |
| 12 | එස්.පී.එම්.ඩබ්.කරුණාරත්න මහතා | සභාපති | වෙද නිවස,මැදගම,කැකිරාව |
| 13 | ඒ.එම්. බස්නායක මහතා | සභාපති | 17/5, කෝට්ටපිටිය. |
| 14 | ඩබ්.එම්. අනිල් ගුණවර්ධන මහතා | සභාපති | 799,යාය 9, දිවුලන්කඩවල |
| 15 | නිහාල් වන්නිආරච්චි මහතා | සභාපති | රාජාංගනය,යාය 10, ගැමුණුපුර |
| 16 | අයි.වී.එෆ්. බන්දුජීව මහතා | සභාපති | තිබ්බිරිකඩල, ශ්‍රාවස්තිපුර. |
| 17 | එම්.පී. ජානක ශ්‍රීලාල් මහතා | සභාපති | 1019, යුනිට් 15, වෙන්ඩ්‍රාසන්පුර, කන්තලේ |
| 18 | එච්.ඒ.උපාලි සේනාරත්න මහතා | සභාපති | උදුම්බරාව, ඒකාබද්ධ මහියංගන, 28, උයන්වත්ත |
| 19 | එච්.එම්. දිසානායක මහතා | උප සභාපති | ව්‍යාපාර කමිටුව, එච් කලාපය,හිරිගොල්ලේගම, තලාව |
| 20 | කේ. හේමරත්න මහතා | උප සභාපති | ඒකාබද්ධ ගො.සංවිධානය, ගලෙන්බිඳුනුවැව |
| 21 | තිස්ස ලියනආරච්චි මහතා | උප සභාපති | 143,මුවකැටගේවෙල, මහවනාවෙල, දෙහිඅ. |
| 22 | ශෂී එදිරිසූරිය මහතා | ලේකම් | රිදීයගම,ඒකාබද්ධ ගොවි සං.බැරගම පාර, අම්බලන්තොට. |
| 23 | අබේසිංහ වෛද්‍යතිලක මහතා | ලේකම් | ඒකාබද්ධ ගොවි සංවිධානය, හුරුළුවැව ගලෙන්බිඳුනුවැව |
| 24 | පී. රත්නායක මයා | ලේකම් | වලවෙවත්ත, අම්බලන්තොට. |
| 25 | යූ.පී.එන්.යූ. කුමාර මහතා | ලේකම් | අංක 15, යාය 06, නව නගරය, මැදිරිගිරිය |
| 26 | ඒ.එම්. ධර්මසේන මහතා | ලේකම් | 43 ඇල, වේරගංතොට, මිණිපේ. |
| 27 | එස්.පී.එම්. ජයවර්ධන මහතා | ලේකම් | 71, යටියල්ප්‍රතාන, දකුණු කවුඩුල්ල. |
| 28 | ඒ.පී. ධර්මකීර්ති මහතා | ලේකම් | සමන්තලායාය, ලේනදොර. |
| 29 | ඊ.කේ.පී. පුෂ්පකුමාර ඒකනායක මහතා | ලේකම් | වැල්ලේවැව, හත්තොට අමුණ. |
| 30 | සිසිර කුමාර මහතා | ලේකම් | වැල්ලේවල, හත්තොට අමුණ මාතලේ. |
| 31 | රොබට් මුතුනායක මහතා | ලේකම් | 51, පානියන්කඩවල. |
| 32 | ආර්.ආර්.ඩබ්.බී.එම්.පී. ගන්දරවත්ත මහතා | ව්‍යාපාර කමිටු ලේකම් | හිඟුරුවැල්පිටිය, දඹුළුහල්මිල්ලාවැව. |
| 33 | එම්.ඒ. ජයසේන මහතා | උප ලේකම් | සුමනවෙළඳසැල, වෙල්තැටිය, ඇඹිලිපිටිය. |
| 34 | ජේ.බී. රන්දෙණිය මහතා | උප ලේකම් | 411/ඩී, මුරුත ගස්වැව, දෙහිඅත්තකණ්ඩිය. |
| 35 | කේ.පී. අශෝක කරුණාසේන මහතා | උප ලේකම් | අංක 1011, බිසෝබණ්ඩාරපුර, මැදිරිගිරිය. |
| 36 | යූ.සී.බී. හේරත් මහතා | උප ලේකම් | කුඩාකත්නෝරුව, මීගලෑව. |
| 37 | එස්.ඒ.ජේ.සුභසිංහ මහතා | භාණ්ඩාගාරික | 92,කොතලාවල පාර, හිඟුරක්ගොඩ. |
| 38 | එස්.එම්.එස්. සමරකෝන් මහතා | භාණ්ඩාගාරික | 618, ඩී 5, මැදිරිගිරිය. |
| 39 | ඩී.ටී.එම්. පුංචිබණ්ඩා මහතා | ගොවි නියෝජිත | 20, සමූහ ගොවිපල, පුබුදුපුර,අනුධපුර. |

2019 මහ කන්නය සඳහා වූ ජල පාලන කමිටු රැස්වීම එම කමිටුවේ සභාපති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී.එම්.එස්.දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් 2019 ඔක්තෝබර් මස 17 වන දින පෙරවරු 10.00 ට පේරාදෙණිය ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන සම්පත් මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලදී .

**ජල පාලන කමිටුවේ සභාපති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මැතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වමින්**

2019/20 මහ කන්නයේ ජලපාලන කමිටුවට සහභාගීවීම සඳහා සපැමිණි දිසාපතිතුමන්ලා , අතිරේක දිසාපතිතුමන්ලා, ප්‍රදේශිය ලේකම්තුමන්ලා, වාරිමාර්ග දෙපාර්තමේන්තු අධ්‍යක්ෂතුමන්ලා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ජල සම්පත් සහ ජලාපවාහන මණ්ඩලයේ නිලධාරීන් ඇතුලු සියලුම නිලධාරීන්, සියලුම ව්‍යාපාර කමිටු නියෝජනය කරන ගොවි නියෝජිත මහත්ම මහත්මීන්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලුම නිලධාරීන් සහ ආරාධනය ලැබ පැමිණ සිටි සම්භාවනීය අමුත්තන් ගෞරව පූර්වකව පිළිගන්නා ලදී .

තවද සභාපතිතුමා විසින් විශේෂ කරුණක් සඳහන් කරමින් මෙම ජල පාලන කමිටු රැස්වීම පවත්වනු ලබන්නේ ජනාධිපති මැතිවරණ සමයක බැවින් මෙම රැස්වීම පවත්වනු ලබන්නේ මැතිවරණ කොමිෂන් සභාව වෙත ලිපියක් යොමුකර ලබාගත් ලිඛිත අවසරය මත බවත්, ඒ අනුව, මැතිවරණ කොමිෂන් සභාවේ නියාමනයන්ට අනුකූලව මෙම රැස්වීම පැවැත්විය යුතු බවත්, වෙනත් දින වල මෙන් දීර්ඝ ලෙස කථා ඉදිරිපත් කිරිම හෝ කිසිදු ආකාරයක දේශපාලන පක්ෂග්‍රාහී වන වචනයක් හෝ විවේචනයක් හෝ නොපැවසිය යුතු බවත්, අවධාරණය කරන ලදී. 2019/20 මහ කන්නය සඳහා ජලය කළමනාකරණය කර ගැනිමේ පරමාර්ථය පමණක් මුල් කරගෙන මෙදින රැස්වීම පවත්වන බවත්, සාකච්ඡා කර තීරණය කරගත යුතු ජල කළමනාකරණයට අදාල කරුණු පමණක් සාකච්ඡා කර, අදාල තීන්දු තීරණ වලට එළඹ, මධ්‍යහ්න 12.30 පමණ වන විට මෙම රැස්වීම අවසන් කල යුතු බවත්, සඳහන් කරන ලදී.

පසුගිය යල කන්නය පිළිබඳ සලකා බැලීමේදී "එච්" කලාපය හා කන්තලේ වාරිමාර්ග බල ප්‍රදේශය තුල යම් ජල හිඟයකට මුහුණ දුන් අතර, සමස්ථයක් වශයෙන් පසුගිය කන්නය 96% ක පමණ සාර්ථකත්වයක් ලැබූ බවත්, දැනට පවතින කාලගුණ තත්වයට අනුව මෙවර මහකන්නයේ 100%ක සාර්ථක වගාවක් අනුමාන කළහැකි බවත්, පෙන්වාදෙන ලදී.

එසේ සාර්ථක මහ කන්නයකට සුභ ප්‍රාර්ථනා කරමින් **පසුගිය 2019 යල කන්නය පිළිබඳ සමාලෝචනය ඉදිරිපත් කිරීම සඳහා ජලපාලන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සඳුන් ගලප්පත්ති මහතාට ආරාධනා කරන ලදී.**

සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරමින් 2019 යල කන්නයේ කොත්මලේ ජලාශයේ සිට අනෙකුත් පහල ජලාශ දක්වා මුදාහරින ලද ජල ප්‍රමාණයන් සංඛ්‍යාත්මකව සවිස්තරව ඉදිරිපත් කරන ලදී. ක්‍රමාරෝපිත රූපසටහන් ඇසුරින් සංඛ්‍යාත්මකව අදාල සමාලෝචනය ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා පද්ධතියට ලැබුණු ජල ප්‍රමාණයන්, ජල හැරවුම්, ජල පරිහරණ දත්ත, වගා බිම් ප්‍රමාණයන් ද ඇතුලත් විය.

**ඉන් අනතුරුව ඉදිරි කන්නයේ අපේක්ෂිත කාලගුණ තත්ත්වය පිළිබඳ සභාව දැනුවත් කරන මෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ආරාධනා කරන ලදී.**

එහිදී මෙම කරුණ සම්බන්ධයෙන් සුපුරුදු පරිදි දැනුවත් කිරීම් සිදුකරනු ලබන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විද්‍යාඥ ආචාර්ය රංජිත් පුන්‍යවර්ධන මහතා මේ වන විට විදේශගතව සිටින බැවින්, ඒ මහතා දිවයිනෙන් බැහැරව යාමට ප්‍රථම මෙම සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා ලබාදුන් වීඩියෝ පටය ප්‍රචාරය කරන ලදී.

එහිදී ආචාර්ය. රංජිත් පුන්‍යවර්ධන මහතා විශේෂයෙන් කරුණු සඳහන් කරමින් ඉදිරි 2019/20 මහ කන්නය සුභවාදී ආරම්භයක් බලාපොරොත්තු විය හැකි බවත්, වසර ගණනාවකට පසු සාර්ථක වර්ෂාපතනයක් දැනටද ලැබෙමින් පවතින බවත්, සඳහන් කර තිබිණ. එසේම ගොවි ජනතාව සතු ජාතික යුතුකමක් වශයෙන් සලකා

- හැකිතාක් අරපිරිමැස්මෙන් පවතින ජල ප්‍රමාණයන් පරිහරණය කරන ලෙසත්,

- හැකිතාක් දුරට වැසි ජලය උපයෝගී කරගෙන වැඩිකල් නොගෙන සති 02 ක් 03 ක් ඇතුලත බිම් සකස් කිරීම සිදුකරන ලෙසත්,

- වී ගොවිතැනේදී මාස 03 ½ වී වර්ග භාවිතා කරන ලෙසත්

- අතිරෙක බෝග වගාව සඳහා කුඹුරු ඉඩම් භාවිතයේ දී හැකි හැමවිටම ජලවහනය සඳහා සුදුසු බිම් වගාව සඳහා තෝරාගන්නා ලෙසත්, එවැනි වැඩි වර්ෂාපතනයක් ඇති වුවහොත්, එවත් අවස්ථාවලදී ජලවහනය දියුණු කිරීම සඳහා මූලිකව අවශ්‍ය පියවර යොදන ලෙසත්, සඳහන් කර තිබිණ.

අනතුරුව සභාපතිතුමා විසින් කරුණු දක්වමින්, මෙයට පෙර මහවැලි නිලධාරීන් සඳහා වූ වැඩමුළුවකදී ද ආචාර්ය පුන්‍යවර්ධන මැතිතුමා මෙම කරුණු සඳහන් කල බවත්, මෙම කරුණු සැලකීමේදී ඉදිරියේ සාර්ථක මහ කන්නයක් බලාපොරොත්තු විය හැකි බවත්, දිවයිනෙන් බැහැරව සිටින අවස්ථාවක දී වුවත් සභාව වෙත මෙම කරුණු ඉදිරිපත් කිරීම සඳහා කටයුතු යෙදීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වන බවත් සඳහන් කරන ලදී.

**ඉන් පසු 2019/20 මහ කන්නය සඳහා යෝජිත ජලය නිකුත් කිරීමේ සැලැස්ම සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා ජලපාලන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉංජිනේරු නිමන්ති මංජුලා මහත්මියට ආරාධනා කරන ලදී.**

ඉදිරි කන්නය සඳහා ජල කළමනාකරණ සැලැස්ම සම්බන්ධයෙන් කරුණු සඳහන් කරමින් මහවැලි පද්ධතියේ හා වාරි පද්ධතියේ සියලුම ප්‍රධාන ජලාශවල දැනට පවතින ජලාශ මට්ටම් හා ඉදිරියේදී එම ජලාශ වල අපේක්ෂිත ජල හැසුරුම් රටාව නඩත්තු වැඩ සඳහා ජල විදුලි බලාගාර සහ ඇල මාර්ග වසා තැබෙන දින වකවානු ආදී කරුණු ද සම්බන්ධයෙන් රූපසටහන් ඇසුරින් සවිස්තරාත්මකව වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එසේම දැනට යම් වර්ෂාපතන තත්වයක් පෙන්නුම් කලද, මේ වන විට බොහොමයක් වාරි ජලාශවල ජල මට්ටම සතුටුදායක තත්වයක නොමැති බවත්, එහෙත් දැනට පෙන්නුම් කරන කාළගුණික සාධක අනුව ඉදිරියේදී වැඩි ජලාශ ධාරිතාවක් අපේක්ෂා කරන බවත්, සඳහන් කරන ලදී.

මෙහිදී නිමන්ති මංජුලා මහත්මිය විසින් විශේෂයෙන් ගොවීන් දැනුවත් කරමින්, සකසන ලද වගා සැලැස්මේ ඉලක්කම්මතම බලා නොසිට දැනට ලැබෙන වාර්ෂාපතනය හා ජල ප්‍රමාණන් අනුව වගා කටයුතු සංවිධානය කරන ලෙසත්, හැකිතාක් දුරට වැසි ජලය උපයෝගී කරගෙන ප්‍රධාන වශයෙන් බිම් සැකසීම කරන ලෙසත්, පවතින ජල මට්ටම් අනුව ජලය භාවිතා කිරීම සඳහා සුදුසු ක්‍රමවේද (වගාබිම් ප්‍රමාණය කළමණාකරනය කර ගැනීම/බෝග වර්ග වෙනස් කිරීම වැනි) භාවිතා කරන ලෙසත්, මෙම කන්නයේ වගා කටයුතු අවසානයේදී ඉදිරි කන්නය සඳහා ද යම් ජල ප්‍රමාණයක් ජලාශ තුල රඳවා ගැනීමට කටයුතු කළයුතු බවත් සඳහන් කරන ලදී.

මෙහිදී සභාපතිතුමා විසින් විශේෂ කරුණු කිහිපයක් කෙරෙහි සභාවේ අවධානය යොමුකරවමින් ,

දැනට සෑම ජලාශයකම පාහේ ප්‍රමාණවත් ජලමට්ටමක් නැති නමුත්, කාලගුණික වාර්තා අනුව ඉදිරියේදී වැඩි ජලධාරිතාවක් බලාපොරොත්තු විය හැකි බවත්, පුරාණ වදන් වලට අනුව "අක්වැස්ස හා ඊලඟ වැසි තුනෙන් පසුව" පද්ධතියේ ප්‍රධාන ජලාශ මෙන්ම, පද්ධතියට අයත් නොවන කුඩා වැව් වලට ජලය ලැබෙනැයි අපේක්ෂා කරන බැවින්, එම වැසි ජලය උපයෝගී කරගෙන වැඩිකල් නොයවා බිම් සැකසීම නිම කරන ලෙසත්, සඳහන් කරන ලදී. මෙහිදී දැනට ගොවිමහතුන් වෙත ලබාදී ඇති වගා කාලසටහනේ ජල පාලන ලේකම්තුමිය විසින් **<u>විශේෂයෙන් සඳහන් කර ඇති කරුණු 03</u>** කෙරෙහි ගොවිමහතුන්ගේ අවධානය නැවතත් යොමුකරවන ලදී.

1) "එහි සඳහන් ජලය නිකුත් කිරීමේ සැලසුම් පවතින ජලාශ ධාරිතාවයන් හා මේ වනවිට නිකුත් කර ඇති කාළගුණික පුරෝකථනයන් ට අනුව සකසා ඇති බව"

2) "වගාව සඳහා මාස 03, 03 ½ වී පමණක් නිර්දේශ කරනු ලබන අතර, සඳහන් කර ඇති වාරි ජල අවශ්‍යතාවයෙන් 30% ක් 40%ක් පමණ වර්ෂාව මගින් ආවරණය කරගත යුතු වේ. ඒ අනුව පළමු බිම් සැකසීම වර්ෂාව උපයෝගී කරගනිමින් සිදුකිරීම වඩාත් සුදුසු බව"

3) "නියමිත වගාබිම් ප්‍රමාණය සහ යෝජිත කාල වකවානු නොඉක්මවීම කන්නය සාර්ථක කරගැනීමට ඉවහල්වනු ඇති බව"

මෙහිදී මාස 03 ½ වී වර්ග අනිවාර්යෙන්ම භාවිතා කරන ලෙස ගොවීන් දැනුවත් කරන ලදී. එසේම මහකන්නයේ සැමවිටම වගා සැලසුම් සිදුකරනු ලබන්නේ යල කන්නය සඳහා යම් ජල ප්‍රමාණයක් ඉතිරි කරගැනීමට බලාපොරොත්තුවෙන් බැවින් ප්‍රමාද නොවී අදාල කාල වකවානුවටම වගා කටයුතු ආරම්භකර, හැකිතාක් දුරට ජලය අරපිරිමැස්මෙන් භාවිතා කරන ලෙසත්, විශේෂයෙන්ම මෙම වාර්තාවන් පුරෝකථනයන් බැවින් හැකිතාක් දුරට නියමිත වෙලාවන්ටම වගා කටයුතු ආරම්භකර, ජලය පරිස්සම් කරගැනීම අපගේ යුතුකමක් බවත්, මෙම කාර්යය මනා ලෙස ඉටුකිරීම සඳහා අනෙකුත් සියළුම ආයතන වලද දායකත්වය ලබාදෙනු ඇතැයි බලාපොරොත්තු වන බවත් සභාපතිතුමන් තවදුරටත් සඳහන් කරන ලදී.

**අනතුරුව 2019/20 මහ කන්නයට යෝජිත වගාකාලසටහන අනුමත කරගැනීම සඳහා සියලු ව්‍යාපාර අනුපිළිවෙලින් සාකච්ඡාවට භාජනය කරන ලදී.**

**<u>අල්ලෙයි ව්‍යාපාරය :-</u>**

ව්‍යාපාර කමිටුවේ ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් දැනටමත් අහස් දියෙන් බිම් සැකසීම ආරම්භ කර ඇති බැවින්, ජලය නිකුත්කිරීමේ දිනය නොවැ: 01 ලෙසත්, අවසාන දිනය පෙබරවාරි 28 ලෙසත් සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීමට එකඟතාවය පලකරන ලදී.

ඒ මහතා විසින් තවත් ඉල්ලීම් 02 ක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

1. මිණිපේ වේල්ලේ සාම්ප්‍රදායික ජල අයිතිය පිළිබඳ අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන්.

2. අල්ලෙයි ව්‍යාපාරයේ මහවැලි ගං ඉවුර ආශ්‍රිතව ජනරංජන වැව ප්‍රදේශයේ වැලි ඉවත් කිරීම සම්බන්ධව .

සභාපතිතුමන් විසින් කරුණු දක්වමින් අංක: 01 කරුණ සඳහා අද දින මහවැලි ජල සුරක්ෂිතතා ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකතුමන් නොමැති බැවින් එතුමන්ගේ ද සහභාගීත්වය ඇතිව වෙනම ම සාකච්ඡාවක දී සාකච්ඡා කළ යුතු බව සඳහන් කරන ලදී. අංක: 02 කරුණ සම්බන්ධයෙන් භූවිද්‍යා හා පතල් කැණීම් කාර්‍යංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරියේ අදාල නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමන්ගේ සහභාගීත්වය ඇතිව වෙනම සාකච්ඡාවක් පවත්වා තීරණයක් ගත යුතු බවත්, ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් ගොවි නියෝජිත මහතා වෙත දන්වන ලදී.

**<u>මාදුරුඔය ව්‍යාපාරය :-</u>**

ව්‍යාපාර කමිටුවේ ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දිනයන් සඳහා එකඟතාවය පල කරන බව සඳහන් කරන ලදී.

**<u>වාකනේරි :-</u>**

ව්‍යාපාර කමිටුවේ ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දිනයන් සඳහා එකඟතාවය පල කරන බව සඳහන් කරන ලදී.

**උල්හිටිය/රත්කිඳ :-**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් දැනට වර්ෂා ජලයෙන් මූලික බිම් සැකසීම සිදුකර ඇති බැවින් නොවැ . 05 සහ මාර්තු 02 වශයෙන් දිනයන් සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි . එහෙත් අදාල දිනයන් නොවැ .10 සහ මාර්තු 07 වශයෙන්ම තබා ගන්නා ලෙසත් දැනට කරගෙන යන අයුරින්ම ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් , කන්නය ආරම්භයේ දී වැසි ලැබුණහොත් යම් වෙනස්කමක් සිදුකිරීම සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදුකල හැකි බවත්, ජල පාලන ලේකම්තුමිය විසින් සඳහන් කරන ලදී . තවද නොවැ . 05 සිට 50% ක ජල ප්‍රමාණයක් ඇල මාර්ග වල ලබා ගන්නා ලෙසත්, දන්වා සිටින ලදී .

**සොරබොර/ මාපාකඩ / දඹරාව: -**

සොරබොර මාපාකඩ සහ දඹරාව යන ව්‍යාපාර 03 නියෝජනය කරමින් ඒකාබද්ධ ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දිනයන් නොවැ . 01 සහ පෙබ. 15 වශයෙන් සංශෝධන කර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. දැනට පවතින තත්වයන් සැලකිල්ලට ගෙන එම ඉල්ලීම සඳහා කමිටුවේ එකඟතාවය පල කරන ලදී .

**නීලබැම්ම : -**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් දැනට මූලික බිම් සැකසීම සිදුකර ඇති බැවින් අදාල දිනයන් සඳහා එකඟතාවය පල කරන ලදී .

**රාජාංගනය : -**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දිනයන් සඳහා එකඟතාවය දක්වන ලදි.

**කලාවැව වම්ඇල / කලාවැව යෝධ ඇල :-**

අදාල ගොවි නියෝජිත මහතා විසින් ජලය නිකුත් කිරීමේ අවසාන දිනය පෙබ: 10 ලෙස සංශෝධනය කර දෙන මෙන් ඉල්ලා සිටි අතර, ඒ සඳහා කමිටුවේ එකඟතාවය පලවිය .

**කලාවැව දකුණු ඇල ;-**

අදාල ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දින වකවානු වලට එකඟ බවත්, ජලය නිකුත් කිරීමේ අවසාන දිනය ලෙස පෙබ: 10 සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව අදාල දිනයන් ඔක්: 17 සහ පෙබ: 10 ලෙස සංශෝධනය කරන ලදී.

**දඹුළු ඔය :-**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දිනයන්හි සංශෝධනයක් සිදුකිරීමට ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව, ආරම්භක දිනය නොවැ: 01 හා අවසාන දිනය පෙබ: 20 ලෙස සංශෝධනය කරන ලදී.

**කන්දලම :-**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දැක්වීමක් සිදුකරන ලදී. අදාල දිනයන්හි සංශෝධනයක් සිදුකිරීමට ඉල්ලීමක් කරන ලද අතර, ඒ අනුව ආරම්භක දිනය ඔක්: 25 හා අවසාන දිනය පෙබ: 15 ලෙස සංශෝධනය කරන ලදී.

**නුවර වැව :-**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දිනයන්හි සංශෝධනයක් සිදුකර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. මෙහිදී වාරිමාර්ග ඉංජිනේරු (අනුරාධපුර) විසින් ද කරුණු දැක්වීමක් සිදුකරන ලදී. මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව නොවැ:05 හා මාර්තු 02 වශයෙන් අදාල දිනයන් සංශෝධනය කරන ලදී.

**<u>නාච්චාදූව :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දැක්වීමක් සිදුකරන ලද අතර, අදාල දිනයන් නොවැ: 01 සහ පෙබ: 28 ලෙස සංශෝධනයක් සිදුකර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. මේ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ආරම්භක දිනය නොවැ :05 සහ අවසාන දිනය මාර්තු 02 වශයෙන් ම දැනට තීරණයේ තබා ගන්නා ලෙසත්, ඉදිරි තත්වය අනුව යම් වෙනසක් සිදුකිරීමට අවශ්‍ය වුවහොත්, සති සාකච්ඡාවේදී තීරණයකට එළැඹිය හැකි බවත් ජලපාලන ලේකම් තුමිය විසින් සඳහන් කරන ලදී.

**<u>තිසා වැව/අභය වැව :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දැක්වීමක් සිදුකරන ලදී. අදාල දිනයන් ඔක්: 25 සහ පෙබ: 15 ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව ඔක්: 25 හා පෙබ: 15 ලෙස අදාල දිනයන් සංශෝධනය කරන ලදී. හැකිතාක් දුරට වැසි ජලය උපයෝගී කරගෙන මූලික බිම් සැකසීම සිදුකරන මෙන් ලේකම්තුමිය විසින් උපදෙස් ලබාදෙන ලදී.

**<u>හුරුළු වැව :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා දීර්ඝ වශයෙන් කරුණු දැක්වීමක් සිදුකල අතර දින වකවානු සඳහා එකඟතාවය පල කර සිටින ලදී.

**<u>හුරුළුපෝෂිත ඇල :-</u>**

අදාල ව්‍යාපාර කමිටු නියෝජිත මහතා විසින් කරුණු දැක්වීමක් සිදුකරන ලද අතර, අදාල දින වකවානු සඳහා එකඟතාවය පල කරන ලදී.

**<u>මිණිපේ වම් ඇල:-</u>**

මේ වනවිට මිණිපේ අමුණ පුනරුත්ථාපන ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදුකරමින් පවතින බැවින් යෝජිත දින වකවානු වලට ජලය ලබා ගැනීම අපහසු බව ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා සඳහන් කරන ලදී. මේ පිළිබඳව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ද කරුණු දක්වා සිටින ලද අතර ජලය නිකුත් කිරීමේ දින නොවැ:01 සහ මාර්තු 10 ලෙස සංශෝධනය විය.

**<u>ඇලහැර :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දැක්වීමක් සිදුකරන ලදී. පසුගිය කන්නය 100% ක් සාර්ථක වූ බවත්, කන්න ආරම්භක දිනය නොවැ :01 ලෙස ගණනය කර, නොවැ : 05 වන විට යම් ජල ප්‍රමාණයක් ලබා දෙන ලෙසත්, ඉල්ලීමක් කරන ලදී.වර්ෂා තත්වය හොඳ මට්ටමකට ලැබුණහොත්, අදාල දින සංශෝධනය කල හැකි වනු ඇති බව ලේකම්තුමිය විසින් සඳහන් කරන ලදී.

එම ගොවි නියෝජිත මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින් ගොවි සංවිධාන සඳහා ලැබිය යුතු හිඟ මුදල් කඩිනමින් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. එමෙන්ම පොහොර හා බීජ ලේකම් කාර්යාල සඳහා විශේෂ දැනුම් දීමක් කර කඩිනමින් ඒවා ලබා දීමට වැඩ පිළිවෙලක් සකස්කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**<u>කන්තලේ :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දැක්වීමක් සිදු කරමින්, ලබාදී ඇති දින වකවානු සඳහා එකඟ බව සඳහන් කල ද, දැනට කන්තලේ ජලාශයේ ජල තත්වය ඉතාමත් පහල මට්ටමේ පවතින බැවින්, අදාල දින වකවානු වලට වගා කටයුතු සිදුකල හැකිද යන්න ගැටළු සහගත බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව දීර්ඝ වශයෙන් මෙම කරුණ පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඇළ මාර්ගයක් සම්බන්ධයෙන් ගොවි නියෝජිත මහතා විසින් ලිඛිත ඉල්ලීමක් ද ඉදිරිපත් කර තිබූ අතර, එය වාරිමාර්ග බල ප්‍රදේශයට අයත් වන්නක් බැවින්, එම කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා සභාපතිතුමන් විසින් එම ලිපිය වාරිමාර්ග අධ්‍යක්ෂතුමිය වෙත යොමුකරන ලදී.

**කවුඩුල්ල :-**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වන ලද අතර, අදාල දින වකවානු වලට එකඟ බව සඳහන් කරන ලදී. ඒ මහතා විසින් දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකරන ලද අතර,පොළොන්නරුව වාරි අධ්‍යක්ෂතුමා අදහස් දක්වමින් මෙම ඇලහැර ,මින්නේරිය ,කවුඩුල්ල, කන්තලේ හා ගිරිතලේ, යන ව්‍යාපාර පද්ධතියේම ජලය නිකුත් කිරීම නොවැ: 20 දිනට යොදා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගොවි නියෝජිත මහතා තවදුරටත් කරුණු දක්වමින් අක්කර 13,500 ක භූමි ප්‍රමාණයක් දක්වා තම මුලු බිම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා යොදා ගෙන එය ජලය නිකුත් කිරීමේ සටහනට ඇතුළත් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. තවද කවුඩුල්ල ජලාශයෙන් පානීය ජලය සඳහා ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා අමතර ජලය ලබා දීමක් අවශ්‍ය බව ඒ මහතා වැඩිදුරටත් සඳහන් කරන ලදී.

වගා බිම් ප්‍රමාණය වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නීත්‍යානුකූලව ලබා දිය යුතු බව ලේකම්තුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

**මින්නේරිය :-**

ව්‍යාපාර කමිටුවේ ගොවි නියෝජිත මහතා කරුණු දක්වන ලදී. පද්ධතියක් වශයෙන් ගත් දින වකවානු වලට එකඟ බව සඳහන් කරන ලදී. එසේ වුවත්, ජලය නිකුත් කිරීමේදී යම් ගැටළු සහගත තත්වයන් ඇතිවිය හැකි බව සඳහන් කරන ලදී. අදාල නියෝජිත මහතා කරුණු ඉදිරිපත් කරමින්, මින්නේරිය ජලාශයේ වතුර මට්ටම අක්කර අඩි 90,000 ක මට්ටමකවත් පවත්වා ගන්නේ නම් ඕනෑම හදිසි අවස්ථාවක කවුඩුල්ල හා කන්තලේ ජලාශ වලට පහසුවෙන් ජලය නිකුත් කිරීමේ හැකියාව ඇති බැවින් , එය යෝජනාවක් වශයෙන් ගරු සභාව වෙත ඉදිරිපත් කරන බව සඳහන් කරන ලදී.

**ගිරිතලේ :-**

අදාල ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් කුඩා වැවක් සමග කටයුතු කරන ව්‍යාපාරයක් ලෙස තම ව්‍යාපාරය අදාල දින වකවානු නො: 05 හා මාර්තු 05 ලෙස සංශෝධනය කරදෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. එහෙත් සමස්ථයක් ලෙස පද්ධතියේම වගා කටයුතු ආරම්භ කිරීම සඳහා අදාල දිනය නොවැ: 20 වශයෙන් තබාගැනීමට එකඟතාවය පල කරන ලදී. යම්හෙයකින් වර්ෂාව ලැබුණහොත් දින වකවානු වල වෙනසක් කර ගත හැකි බව ලේකම්තුමිය විසින් සඳහන් කරන ලදී.

**පරාක්‍රම සමුද්‍රය :-**

අදාල ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් , අදාල දින වකවානු නොවැ: 01 සහ පෙබ: 20 ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලද අතර ඒ සඳහා එකඟතාවය ලබාදෙන ලදී.

**හත්තොට අමුණ :-**

අදාල ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් තම දින වකවානු නොවැ: 01 සහ මාර්තු 15 වශයෙන් සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී . ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව එය නොවැ: 01 සහ පෙබ: 28 වශයෙන් සංශෝධනය කරන ලදී. තවද විශේෂ ගැටළුවක් ඇතිවුවහොත් අදාල දින වකවානු වල වෙනසක් සිදුකල හැකි බව ද සඳහන් කරන ලදී.

**උඩවලව වම් ඇල / උඩවලව දකුණු ඇල :-**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු ඉදිරිපත් කරමින් පසුගිය කන්නයේ ඉතා අඩු වර්ෂාපතනයක් ලැබුනද දැඩි කැපවීමෙන් කටයුතු කිරීම හේතුවෙන් කන්නය සාර්ථක කරගැනීමට හැකිවුන බව සඳහන් කරන ලදී. දැනට වර්ෂා ජලයෙන් මඩ වැඩ ආරම්භ කර ඇති බැවින් අදාල දිනයන් ඔක්: 22 සහ පෙබ: 04 ලෙස සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීම සඳහා එකඟතාවය ලබාදෙන ලදී.

**<u>ලියන්ගස්තොට වම් ඇල :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වමින් අදාල දින වකවානු නොවැ: 01 හා මාර්තු 01 ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඒ සඳහා එකඟතාවය ලබා දෙන ලදී.

**<u>ලියන්ගස්තොට දකුණු ඇල :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වන ලද අතර, අදාල දින වකවානු සඳහා එකඟ බවත් මේ වන විට වැසි ජලය උපයෝගි කරගෙන මඩ වැඩ බොහෝදුරට අවසන් කර ඇති බවත් සඳහන් කරන ලදී.

**<u>කල්තොට අමුණ :-</u>**

ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතා කරුණු දක්වන ලද අතර, අදාල දින වකවානු ඔක්: 25 සහ පෙබ: 15 වශයෙන් සංශෝධනය කරදෙන මෙන් ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීම සඳහා එකඟතාවය ලබා දෙන ලදී.

ඉන් අනතුරුව සභාපතිතුමන් විසින් කරුණු දැක්වීමක් සිදුකරන ලදී. එහිදී "ජලය යනු ඉතාමත් හිඟ සම්පතක් බවත්, එය ඉතා අරපිරිමැස්මෙන් භාවිතා කල යුතු බවත්, හැමවිටම ලැබෙන ජල ප්‍රමාණය අපතේ නොයවා, ඉතාමත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට හැමවිටම ගොවි මහතුන් කටයුතු කල යුතු බවත්, සඳහන් කරන ලදී.

එසේම මෙදින රැස්වීම සඳහා සහභාගී වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් , සියලුම ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහතුන්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් ඇතුළු සියලුම නිලධාරීන් හා මෙම රැස්වීම නිසිලෙස සංවිධාන කටයුතු සිදුකල ජලපාලන ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන් ඇතුළු හැමදෙනාටම විශේෂ ස්තූතිය පල කරන ලදී. මෙහිදී තවත් විශේෂ කරුණක් වශයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් කලාපවල ජලය ලබාදීමේදී ගැටළු සහගත තත්වයන් පවතින ව්‍යාපාරවල ගැටළු නිරාකරණය කරගැනීම සඳහා අදාල අනෙකුත් ආයතන හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අදාල නිලධාරීන්ගේද සහභාගීත්වය ඇතිව වෙනම ම සාකච්ඡාවන් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන මෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදී. එසේම විශේෂයෙන් ඊලඟ ජල කළමනාකරණ කමිටුව සඳහා එක් ව්‍යාපාර කමිටුවකින් සියලුම දත්ත රැගත් එක් ගොවි නියෝජිතවරයකු පමණක් සහභාගී වන ලෙසත්, ඉල්ලීමක් කරන ලදී. අවසන් වශයෙන් ඉදිරි කන්නයේ සුබදායී 100% ක වගා අස්වැන්නක් ලැබේවා යන පරමාර්ථය ඇතිව, පුරාණ චාරිත්‍රානුකූලව වගා කටයුතු ආරම්භ කරන ලෙසත් ඉදිරි කන්නය සුබදායී වන්නට ප්‍රාර්ථනය කරන බවත් සඳහන් කරන ලදී.

අවසන් වශයෙන් ගරු ලේකම්, ජලපාලන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඉංජිනේරු තිලකා සමරතුංග මෙනවිය ස්තුති කථාව කරමින්, මහකන්නයේ වර්ෂාවෙන් වැඩි ජල ප්‍රමාණයක් අපේක්ෂා කරන බවත්, හැකිතාක් දුරට වැසි ජලය උපයෝගී කරගෙන වගා කටයුතු සිදුකරන ලෙසත්, සඳහන් කරන ලදී. එසේම පද්ධතියේ ඉහල සිට පහල ජලාශ වෙත ජලය ගෙනඒම, ඒ ඒ ජලාශ වල ජලය හැසිරවීම සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් විස්තරයක් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. හැකිතාක් දුරට ජලය අරපිරිමැස්මෙන් භාවිතා කරන මෙන් ගොවි මහතුන් දැනුවත් කරන ලදී. මෙදින ජලපාලන කමිටුව සඳහා සහභාගී වූ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත්, ව්‍යාපාර කමිටු ගොවි නියෝජිත මහත්ම මහත්මීන්ටත් තම ස්තූතිය පල කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ නියමයන්ට අනුව, පස්වරු 12.30 පමණ වන විට අදාල වැඩකටයුතු අවසන් කිරීමට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් සියලුම දෙනා වෙත විශේෂයෙන් ස්තුතිවන්ත වන බව සඳහන් කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඉංජි. තිලකා සමරතුංග,
ලේකම් - ජල කළමනාකරණ කමිටුව ,
අධ්‍යක්ෂ- ජලපාලන ලේකම් කාර්යාලය,
<u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය</u>.